## කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

### බාහිර විභාග අංශය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2009

### (2010 මැයි / ජූනි)

### මානවශාස්ත්‍ර පීඨය

### සිංහල - SINH E 2025

### සංස්කෘතිය, ජනශ්‍රැතිය හා භාෂා අධ්‍යයනය

**යටත් පිරිසෙයින් I කොටසින් එක් ප්‍රශ්නයක් ද, II කොටසින් එක් ප්‍රශ්නයක් ද III කොටසින් ප්‍රශ්න දෙකක් ද අයත් වන සේ ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.**

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි

කාලය : පැය 03 යි

---

### I කොටස

01. භෞතික සංස්කෘතිය සහ අභෞතික සංස්කෘතිය අතර ඇති සබඳතාව කවරේ ද යි නිදර්ශනාශ්‍රයෙන් පරීක්ෂා කරන්න.

02. උපසංස්කෘතීන් බිහි වීමෙහිලා හේතුකාරක වන සමාජ - ආර්ථික සාධක පැහැදිලි කරන්න.

03. වාරිකාර්මිකයන්ගේ ශිල්ප ඥානය පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින් පුරාතන ශ්‍රී ලංකාවේ වාරි සංස්කෘතිය පිළිබඳ අගැයීමක් කරන්න.

නැතහොත්,

පහත සඳහන් මාතෘකා අතරින් <u>දෙකක්</u> (02) පිළිබඳව සටහන් සපයන්න.

(අ). ජනප්‍රිය සංස්කෘතිය

(ආ). සංස්කෘතික සංවිධානය

(ඇ). සමාජානුයෝජනය

(ඈ). සංස්කෘතිකාංගයක් වශයෙන් භාෂාවෙහි ඇති වැදගත්කම

## II කොටස

04. "ජනශ්‍රැතියෙහි පදනම ජනජීවිතය යි" විභාග කරන්න.

05. "ප්‍රස්තාවපිරුළුවල අන්තර්ගත වන්නේ මිනිසුන් අත්දැකීම් ආශ්‍රයෙන් උකහා ගත් ඥානය යි" මේ ප්‍රකාශයට එකඟ විය හැකි ද යි විමසන්න.

06. දේශීය ජනජීවිතය අධ්‍යයනය කිරීමෙහි ලා, සිංහල ජනකතාවෙන් කෙබඳු පිටුබලයක් ලද හැකි ද යි නිදසුන් සහිතව පිරික්සන්න.

නැතහොත්,

සිංහල ජනකවියෙහි පිළිබිඹු වන වී ගොවිතැන පිළිබඳ සාම්ප්‍රදායික දැනුම කෙබඳු ද යි නිදර්ශනාත්මකව විභාග කරන්න.

## III කොටස

07. " සිංහලය ඉන්දු යුරෝපීය භාෂා පවුලට අයත් වූවකි. " විමසන්න.

නැතහොත්,

සිංහලය අනාර්ය භාෂාවක් යැයි ඇතැම් විද්වතුන් කර ඇති ප්‍රකාශයන්ට පාදක වූ කරුණු පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

08. "පණකුරු පසෙකි එ ද
ලුහු ගුරු බෙයින් දස වේ
ගතකුරු ද වේ විස්සෙක්
වහරට යුහු සිය බසැ. "

මෙම ගීය ආශ්‍රය කර ගනිමින් සිදත් සඟරාවේ වර්ණමාලාව පිළිබඳ විවේචනාත්මක විග්‍රහයක් කරන්න.

09. සන්ධි වීම හා සන්ධි කිරීම හඳුන්වා, සිදත් සඟරාවේ සන්ධි විධි පිළිබඳ විමර්ශනයක් කරන්න.

10. සමාස විධිය පිළිබඳ සිදත් සඟරාවේ ඉගැන්වීම් විමසුමට ලක් කොට විභක්ති සමාසය සනිදර්ශනව පහදන්න.

*****************